සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

47 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)

සිංහල සාහිත්‍ය රසාස්වාදය I, II
இலக்கிய நயம் சிங்களம் I, II
Appreciation of Sinhala Literary Texts I, II

## සිංහල සාහිත්‍ය රසාස්වාදය - II පත්‍රය

※ **පළමුවන** ප්‍රශ්නය ද, **2, 3, 4, 5** ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න **දෙකක් ද ඇතුළු ව ප්‍රශ්න තුනකට** පිළිතුරු සපයන්න.

※ මෙම පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට පිළිතුරු ලියන පොත භාවිත කරන්න.

**1.** පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් රසාස්වාදයක් ලියන්න.

වැහි වලා කුළ, පැ කළු යැ යි ඔබේ
නො හොබිති යි කිසි ලෙස් නො සතොස් නො වන්
සිරුරු පැයෙනු'ගත් සුදනෝ ලොවේ
නො හඳුනත් උතුමන් ගුණයෙන් විනා.

පැනැ-නැගී අහසේ පැතිරී ගොසින්,
මහ ගිමන් සිඳුවා සත සිත් තොසින්,
කුඹුරු-වැව්-පොකුණුත් පුරවා දියෙන්,
ලොවට දෙන්නා ඔබ යි අහරත් පැනුත්.

නද අසා ඔබ ගේ පැහැයත් බලා,
මොනරු පිල් විදහා රඟ දෙත් නදින්,
අමුතුයෙන් පණවත් බව ලත් සෙයින්,
තුරු ලියත් ලිය-ලයි සැනැසී දියෙන්.

සුදු වලා කුළු බෝ මැ අහස් කුසේ
ඉහළ යෙයි; ඔබ යැම පහත් වැ මැ යි
එ පුදුමෙක් ද? උසස් නැණවත් දනෝ
ගුණ බරින් නැමුණෝ'ව පවතිත් නිතින්

කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ
කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්.

ගුණ බලා ඔබ ගේ ලො සබා දහම්
'ඔබ'ය් අන් කිසිවෙක් නිසි නැ' කියා
විදුලියත් පැහැ පත් රන දම් සෙයින්
පළඳවන්නෙ ඔබේ ගෙලෙ මැ යි බලන්.

- මෙම පැදි පෙළට පාදක වූ අත්දැකීම
- එම අත්දැකීම ප්‍රතිනිර්මාණය සඳහා කවියා යොදා ගත් සිද්ධි හා අවස්ථා
- මෙම පද්‍ය පන්තියේ භාෂා භාවිතය
- සමාජයේ විවිධ පුද්ගල චර්යා නිරූපණය කිරීමට කවියා ගෙන ඇති උත්සාහය
- මෙම පද්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට හේතු වී ඇති කරුණු

(ලකුණු 06 × 5 = 30යි)

[අවවැනි පිටුව බලන්න.

2. ළමා සිතුම් පැතුම් සහ ගති පැවතුම් නිරූපණයෙහි ලා 'වෙසක් පහන' කෙටිකතාවේ රචකයා දැක්වූ සමත්කම නිදසුන් **තුනක්වත්** දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15යි)

3. 'අලුත ගෙනා මනාලිය' පද්‍ය පන්තියේ දී මනාලියකගේ චර්යා මැනවින් නිරූපණය කිරීමට කවියා සමත් වී ඇති ආකාරය නිදසුන් **තුනක්වත්** භාවිත කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

4. "සමන් හැර ගිය පභාවතියගේ සිත දිනා ගැනීමට කුස කුමාරයා ගත් උත්සාහය කුස ජාතකයෙන් මැනවින් නිරූපණය වේ." නිදසුන් **තුනක්වත්** ඇසුරෙන් විමසන්න. (ලකුණු 15යි)

5. උචිත පද, සංකල්ප රූප සහ රිද්මය භාවිතය 'වැස්ස' පද්‍ය පන්තියේ සාර්ථකත්වයට හේතු වී ඇති ආකාරය නිදසුන් **තුනක්වත්** ආශ්‍රයෙන් විමර්ශනය කරන්න. (ලකුණු 15යි)

* * *

PAST PAPERS WIKI
WWW.PastPapers.WIKI
Past Papers Wiki - Download More Past Papers and Study Well!